විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS
ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

පරපුරක අභිමානය
தலைமுறையொன்றின் பெருமிதம்
Pride of a Generation

මගේ අංකය / எனது இல. / My No. } විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි අංක: 07/2022 (I)

ඔබේ අංකය / உமது இல. / Your No. } ......................

දිනය / திகதி / Date } 2022.12.30

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්,
සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්,

**<u>විශ්‍රාමිකයන්ගේ ජීවිත සහතික - 2023</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් ම විසින් නිකුත් කරන ලද 2022.12.13 දිනැති විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි 07/2022 වෙත ඔබගේ අවධානය යොමු කරවමි.

02. ඒ අනුව එක් එක් විශ්‍රාමිකයාට එක් ආකෘති පත්‍රයක් වෙනුවට, ග්‍රාම නිලධාරී වසම් මට්ටමෙන් එක් ආකෘති පත්‍රයක් පමණක් වන සේ ක්‍රමවේදය වෙනස් කිරීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව කටයුතු කර ඇත. එම ආකෘතිය අදාළ තොරතුරු තාක්ෂණ පද්ධතිය හරහා ලබා ගන්නා ආකාරය පිළිබඳ උපදෙස් මේ සමග අමුණා ඇත (ඇමුණුම I).

03. ඇඟිලි සලකුණ මගින් ජීවිත සහතිකය තහවුරු කිරීම සඳහා ලියාපදිංචි වී නොමැති, ඉහත ආකෘතියට ඇතුළත් විය යුතු යම් විශ්‍රාමිකයෙකුගේ තොරතුරු අදාළ ග්‍රාම නිලධාරී වසමෙහි ආකෘතියට ඇතුළත් වී නොමැති නම් එවැනි විශ්‍රාමිකයන්ගේ ජීවිත සහතිකය ලබා ගැනීම සඳහා, විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි 07/2022 මගින් නිකුත් කළ ඇමුණුම 01 ආකෘතියෙහි හිස් ආකෘතියක් ග්‍රාම නිලධාරීන් වෙත නිකුත් කිරීම සුදුසුය. එවැනි විශ්‍රාමිකයන් අදාළ ග්‍රාම නිලධාරී වසමෙහි ස්ථිර පදිංචි බව ග්‍රාම නිලධාරී විසින් සනාථ කර ගත යුතුය.

04. අත්සන් කරන ලද ඉහත ආකෘතිය ග්‍රාම නිලධාරීන් විසින් ප්‍රාදේශීය ලේකම් වෙත භාරදුන් පසු විශ්‍රාම වැටුප් නිලධාරීන් විසින් ජීවිත සහතික, දත්ත පද්ධතිය තුළ යාවත්කාලීන කිරීමේ දී ඉහත විශ්‍රාමිකයන්ට අදාළ ග්‍රාම නිලධාරී වසම පද්ධතිය තුළ යාවත්කාලීන කර නොමැති නම් එය යාවත්කාලීන කිරීමට කටයුතු කළ යුතුය.

05. ජීවිත සහතිකය ඇඟිලි සලකුණ මගින් තහවුරු කිරීම සඳහා ලියාපදිංචි වී ඇති විශ්‍රාමිකයන් ග්‍රාම නිලධාරී වෙත පැමිණියහොත් ඇඟිලි සලකුණ මගින් ජීවිත සහතිකය තහවුරු කළ හැකි බැංකු ශාඛාවක් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් වෙත යොමු කරන ලෙසට ග්‍රාම නිලධාරීන් දැනුවත් කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

06. කෙටි කාලසීමාවක් තුළ පරිශීලකයන් බොහෝ සංඛ්‍යාවක් මෙම තොරතුරු තාක්ෂණ පද්ධතිය වෙත පිවිස කටයුතු කරන අවස්ථාවන්හි දී පද්ධතිය පරිශීලනයේ හා පද්ධතිය තුළට ඇතුළු වීමේ දුෂ්කරතා මතු විය හැකිය.

**ජේ.ජගත් ඩී. ඩයස්**
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්
ලේකම් - රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කරු. දැ.ගැ.ස

මාලිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை கொழும்பு 10. Maligawatta, Colombo 10.
Hot line: 1970, Direct line: 2209800, Fax: 2342078, Email: info@pensions.gov.lk, Web: www.pensions.gov.lk

ඇමුණුම I

**<u>ඇඹිලි සලකුණු මගින් ජීවිත සහතික ලබා දී ඇති විශ්‍රාමිකයන් පිළිබඳ තොරතුරු ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලබා ගැනීම.</u>**


ඇඹිලි සලකුණු මගින් ජීවිත සහතික ලබා දී ඇති විශ්‍රාමිකයන් පිළිබඳ තොරතුරු ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලබා ගැනීමට හැකි පරිදි දත්ත පද්ධතියක් සකස් කර ඇත. මෙම තොරතුරු ලබා ගැනීමට ප්‍රාදේශීය ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ගණකාධිකාරීවරුන් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සේවයේ නියුතු විශ්‍රාම වැටුප් නිලධාරීන් වෙත හැකියාව ඇත.

**පද්ධතිය සඳහා පිවිසුම**


## 1 පද්ධතිය අභ්‍යන්තරයට පිවිසීම

දැනටමත් ඔබට විෂය භාර නිලධාරියෙකු ලෙස විශ්‍රාම වැටුප් කළමනාකරණ පද්ධතියට පිවිසීමට සක්‍රිය ගිණුමක් පවතී නම්, එම user name සහ password භාවිතයෙන්ම මෙම පද්ධතියට ඇතුළත් වීමට හැකියාව ඇත. ඔබට විෂය භාර නිලධාරියෙකු ලෙස දැනට භාවිතා කරන ගිණුමක් නොමැති නම් විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 03/2015 ට අදාළ මාර්ගෝපදේශ අත්පොත භාවිතයෙන් නව ගිණුමක් සකස් කර ගත යුතුය.


(I) <u>www.pensions.gov.lk</u> ලෙස ඇතුළත් කිරීම මගින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු වෙබ් අඩවිය වෙත පිවිසෙන්න. දෙපාර්තමේන්තු වෙබ් පිටුවෙහි වූ PENSION MANAGEMENT SYSTEM මත click කරන්න




(II) ඉන් පසු දිස්වන අතුරුමුහුණතෙහි (interface) තුන්වන ටයිලය මත click කරන්න.





(III) User name සහ Password ඇතුළත් කර Login බටනය මත click කරන්න.




(IV) එලෙස ගිණුමට පිවිසෙන විට ඔබ විසින් ගිණුම සකස් කිරීමේදී ලබා දුන් දුරකථන අංකයට රහස් කේතයක් ලැබෙන අතර එම කේතය ඇතුළත් කර Confirm බටනය click කරන්න. ඉන්පසු ලැබෙන අතුරු මුහුණතෙහි අදාළ ආයතනය නිවැරදිව තෝරන්න.







(V) එවිට පහත පරිදි අතුරු මුහුණතක් ලැබෙන අතර එහි Dashboard මත click කරන්න.

**සැ.යු - මෙම පද්ධතයේ දත්ත විශාල ප්‍රමාණයක් ඇති බැවින් පද්ධතිය භාවිතයේදී දත්ත Load වීමට යම් කාලයක් ගත විය හැකිය.**




(VI) ඉන් පසු පහත ආකාරයේ අතුරු මුහුණතක් දිස් වේ. එහි ඇතුළත් Tile වලට අදාළව විස්තරයක් පහත සඳහන් කර ඇත.



1. LC Digital – Completed

ඇඟිලි සලකුණු මඟින් ජීවිත සහතික ලබා දී ඇති විශ්‍රාමිකයන්

2. LC Digital – Manually Completed

ඇඟිලි සලකුණු මඟින් ජීවිත සහතික ලබා දීමේ පහසුකම පැවතියද ග්‍රාම නිලධාරි හරහා ජීවිත සහතික ලබා දී ඇති විශ්‍රාමිකයින්

3. LC Digital – Pending

ඇඟිලි සලකුණු මඟින් ජීවිත සහතික ලබා දීමේ පහසුකම පැවතියද තවමත් ජීවිත සහතික ලබා නොදුන් විශ්‍රාමිකයන් ( ඇඟිලි සලකුණු මඟින් හෝ ග්‍රාම නිලධාරි මඟින්)


4. LC Manual – Completed

ග්‍රාම නිලධාරී මඟින් ජීවිත සහතික ලබා දුන් විශ්‍රාමිකයින්

5. LC Manual – Pending

ග්‍රාම නිලධාරී මඟින් ජීවිත සහතික ලබා දී නොමැති විශ්‍රාමිකයින්

(VII) LC Manual – Pending Tile එක පහත පරිදි වන අතර එහි අදාළ වර්ෂය සහ ග්‍රාම නිලධාරි වසම තෝරා Download PDF මඟින් අදාළ විශ්‍රාමිකයන් පිළිබඳ තොරතුරු පත්‍රිකාවක් මුද්‍රණය කර ගත හැක.



## Form Issued with Pension Intruction Letter No. 07/2022

## Pensioner's Life Certificate - 2023

| District | Colombo | Divisional Secretariat | Maharagama | Grama Niladhari Division/No | Thalawathugoda West |
|---|---|---|---|---|---|

| # | Name of the pensioner | Pension Number (Type/Number) | NIC Number | Contact Number | Signature | Remarks |
|---|---|---|---|---|---|---|
| 1 | MRS .[redacted] | [redacted] | [redacted] | [redacted] | | |
| 2 | MRS [redacted] | [redacted] | [redacted] | [redacted] | | |
| 3 | MR. [redacted] | [redacted] | [redacted] | [redacted] | | |
| 4 | MR. [redacted] | [redacted] | [redacted] | [redacted] | | |

.

I certify that the signatures of the above pensioners are affixed in my presence.

.

.

........................................ ..................................................................

Date | Signature of Grama Niladhari and Official Stamp

Activate Windows
Go to PC settings to activate Windows